**ශීර්ෂය 124 - ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ**

**-------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.2 **තත්ත්වාගණනය කල මතය**

**-------------------------------------**

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

-----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය තත්ත්ව ආගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂිත කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සකසා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැරවූ අවස්ථා පහත දැක්වේ.

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2018 දෙසැම්බර් 31 දිනට රු.982,563,593 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු1,102,609,470 ලෙස සංශෝධනය කර තිබූ අතර ඒ හේතුවෙන් වත්කම්වල ආරම්භක ශේෂය රු.120,045,877 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙම අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛනයට අමතරව ප්‍රාථමික කර්මාන්ත අංශයේ ස්ථාවර වත්කම් ලේඛනයද සැලකිල්ලට ගැනීම හේතුවෙන් මෙම වෙනස සිදු වී ඇත. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධ යටතේ දේපල හා පිරියත වටිනාකම වූ රු.1,023,038,293 ක් දේපළ පිරියත හා උපකරණ සංචිත වශයෙන් දැක්විය යුතු වුවද එම සංචිතය ඇතුළත් කර නොතිබුණි. | එම | දේපල පිරියත හා උපකරණ වටිනාකමට සමාන වටිනාකමක් දේපල පිරියත හා උපකරණ සංචිත වශයෙන් දැක්විය යුතු වුවද අතපසු වීමකින් එම වටිනාකම ශුද්ධ වත්කම් යටතේ ඇතුලත් වී ඇත. |

### 1.6.2 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු.349.513 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශය වර්ෂය තුළ දී වාර කිහිපයකදී ආයතන සංයුතිය වෙනස් වීම හේතුවෙන් ගිණුම් කටයුතු වලදී ඒකාබද්ධ කිරීමට සිදුවීම නිසා නිසි තොරතුරු රැස්කර ගැනීමට තිබූ අපහසුව සහ සැසඳීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත්කර තිබූ ප්‍රාග්ධන වියදම් භාණ්ඩාගාර මුද්‍රිත අනුව වූ ප්‍රාග්ධන වියදම්වලට වඩා රු.488,240,943 ක් වැඩියෙන් දක්වා තිබුණි. | එම | හේතුවෙන් මෙම දෝෂය සිදුවී ඇත. පසුපිටෙහි අගයන්වල එකතුව ඉදිරි පිටුවට රැගෙන ඒමේදී සිදු වූ අතපසුවීමක් බව දන්වා සිටින අතර විගණන විමසුමෙහි පෙන්වා ඇති සටහන් නිවැරදි වේ. |
| (ඇ) | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් 2019 තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ අමාත්‍යාංශයේ තැන්පතු ගිණුම් ශේෂය රු.58,304,665 ක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය රු.58,254,934 ක් වූ බැවින් එම ගිණුම අතර රු.49,731 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම | ප්‍රාථමික කර්මාන්ත අංශයෙහි 2019 මැයි මස පොදු තැන්පත් ගිණුමේ ලැබීම් ලෙස ගිණුම්ගත වීමට තිබූ රු. 49,731.07ක මුදල CIGAS වැඩසටහනෙහි අදාල මස ලැබීම් ලෙස ගිණුම්ගත නොවී ආරම්භක ශේෂයට ඇතුළත් වීම නිසා දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර ගිණුම් අතර වර්ෂ අවසාන ශේෂයෙහි රු.49,731.07ක වෙනසක් ඇතිවී තිබුණි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 (vi ) පරිදි අක්මුදල් ගැලපුම් ගිණුමක් සකස් කර නොතිබුණි. | එම | 2019 වර්ෂයේ සිදුවූ ගනුදෙනු පදනම්ව අක්මුදල් ගැලපුම් ගිණුම සකස් කර පිටපතක් ලෙස ඉදිරිපත් කර ඇත. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී අමාත්‍යාංශය විසින් වර්ෂය තුළදී මුදලින් දරන ලද වියදම් ඇතුළත් ශේෂ පිරික්සුමේ සලදහන් අගයන් ඇතුළත්කර සකස් කර නොතිබුණු අතර භාණ්ඩාගාර ප්‍රකාශ අනුව වෙනත් දෙපාර්තමේන්තු වලින් දරන ලද වියදම්ද ඇතුළත් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | මෙම අමාත්‍යාංශය 2019 මුල් මාස 4 දී කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් සෘජුවම 193 වැය ශීර්ෂයෙන් භාණ්ඩාගාරයට ගිණුම් විස්තර වාර්තා කළ අතර ඊට පසුව මැයි සිට දෙසැම්බර් දක්වා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය හා මෙම අමාත්‍යාංශය සම්බන්ධ වීමෙන් 124 වැය ශීර්ෂයෙන් භාණ්ඩාගාරයට වියදම් වාර්තා කරන ලදී. පසුව ගිණුම්වල සිදුවූ දෝෂ සියල්ල වර්ෂය |

| | | | |
|---|---|---|---|
| | | | අවසානයේ නිවැරදි කිරීමට කටයුතු කළ අතර එම ගැලපීම් සටහන් මත මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමට යාමේදී යම් යම් අතපසුවීම් සිදුවී ඇත. |

2. **මූල්‍ය සමාලෝචනය**

--------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| **(අ)** | වර්ෂය තුළ සැළසුම් කල පරිදි වැය විෂයයන් 04 ක් සඳහා භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සළසා තිබුණු රු.1,778,926,657 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකිවී තිබුණි . | සැළසුම්වලට අනුකූලවන පරිදි වැය විෂයයන් ඇතිකර ගත යුතු වීම. | එකඟවේ. |
| **(ආ)** | මුදල් රෙගුලාසි 50 (ආ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙළ කිරීම ගණන් දීමේ නිළධාරිගේ වගකීම වුවත්**,** අමාත්‍යාංශය වැය විෂයයන් 93 කට අදාළව සළසා තිබුණු රු.6,319,672,000 ක් වූ ප්‍රතිපාදනයෙන් සියයට 10 ත් සියයට 100 ත් අතර පරාසයක පැවති ඉතිරි කිරීම් රු.2,278,724,285 ක් වූ අතර එය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 36 ක් වී තිබුණි**.** | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතු වීම. | රාජ්‍ය මූල්‍ය වර්ෂයකට සැලසුම් කළ ද ගැසට් නිවේදන 3 ක් (01/2019,03/2019,09/2019) මඟින් රාජ්‍ය පාලන යාන්ත්‍රණය අවස්ථා 3 ක දී සංශෝධනය වූ අතර ඒ අනුව වියදම් කළමනාකරණය එක දිගට පවත්වා ගැනීමට නොහැකි විය. තවද භාණ්ඩාගාරය විසින් වියදම් සීමා කිරීමට අවස්ථා 2 ක දී චක්‍රලේඛ (04/2016(ii),07/2019) නිකුත් කිරීමද ප්‍රතිපාදන ඉතුරු වීමට හේතුවූ බව දක්වා තිබුණි. |
| **(ඇ)** | සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ ප්‍රතිපාදනවලට අමතරව පුනරාවර්තන වැය විෂයයන් හයක් හා ප්‍රාග්ධන වැය විෂයන් තුනක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් සලසා තිබුණි. අවස්ථා නමයකදී මාරු කළ මුදලින් ද සියයට 100 ක් හෙවත් රු.63,265,670 ක් ඉතිරිකර පැවතිණි. | මාරුකර ගන්නාලද මුදල් අදාලඅරමුණු වෙනුවෙන් වැය කල යුතු බව. | 2019 වර්ෂය තුළ අනුමත වූ අයවැය ඇස්තමේන්තු තුළ අමාත්‍යාංශය මෙහෙයවීමේදී අමාත්‍යාංශයේ අරමුණු සංශෝධනය වෙමින් වෙනත් අමාත්‍යාංශය සමඟ අවස්ථා තුනකදී සංශෝධනයට ලක්විය. වෙන්වූ ප්‍රතිපාදන සංශෝධිත අවස්ථාවලදී වියදම් දැරීමට ප්‍රමාණවත් නොවූ විට ඉතිරිව පැවති ශීර්ෂවල ප්‍රතිපාදන මාරුකර ගනු ලැබූවද නැවත |

| | | |
|---|---|---|
| | | නැවතත් අමාත්‍යාංශයේ අරමුණු වෙනස්වීම නිසා වියදම් දැරීමට අවස්ථාවක් නොලැබීමද නිසා ප්‍රතිපාදන ඉතිරි විය. තවද, භාණ්ඩාගාර චක්‍රලේඛ මගින් වියදම් සීමා කිරීම සහ මුදල් අග්‍රිම නොලැබීමද ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී ඇත. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ වර්ෂාපතනය වැඩිකිරීමේ හැකියාව සොයා බැලීම සඳහා චීනයේ කාළගුණ සේවය පිළිබඳ විද්‍යායතනයේ විද්‍යාඥයකු සහ හයිකැන් කාළගුණ නවීකරණ මධ්‍යස්ථානයේ විශේෂඥවරයකු 2018 මෙරටට ගෙන්වා ගැනීමට රු.1,398,448 ක් වියදම් කර තිබුණි. එම වාර්තාව අමාත්‍යාංශය විසින් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. කැබිනට් මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් විදුලිබල පුනර්ජීවන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් පවත් වන ලෙස ලේකම්වරයා වෙත උපදෙස් ලබා දී තිබූ නමුත් එවැනි සාකච්ඡාවක් පවත්වා නොතිබුණි. මේ අතර සමාලෝචිත වර්ෂයේදී නැවතත් චීනයෙන් නිලධාරීන් 07 දෙනෙකු මෙරටට ගෙන්වාගෙන ඒ සඳහා රු.2,113,560 ක් වැයකර තිබුණි. කෙසේ වුවද එම ව්‍යාපෘතිය අතරමඟ නතර කර තිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බොරලන්ද සත්ව ගොවිපල සංවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් 2016 වර්ෂයේ සිට 2019 දක්වා වූ ඉදිරි වර්ෂ 03 සඳහා රු.2,025,900,000 ක ප්‍රතිපාදනයන් වෙන්කර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට කිරි ගවයින් මිළදී ගැනීමට, ගොවිපල භූමියේ තෘණ වගා කිරීම හා තෘණ වගාව සඳහා අක්කර 10 ක ජලනල පද්ධතියක් ස්ථාපිත කිරීමට සහ ගොවිපල භූමියේ පස පරීක්ෂාව සඳහා රු.55,484,214 ක් වියදම් කර තිබුණි. ගොවිපලේ පාංශු ස්ථරයේ අයහපත් තත්ත්වය මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී තිබුණි. | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. | ප්‍රවාහනයේදී සිදුවූ කිසියම් ගැටළු සහගත තත්ත්වයන් සහ ගොවපගේ ඇති අපිරිසිදු තත්ත්වයන් හේතුකොට ගෙන විෂබීජ ශරීරගත වීම නිසා සතුන් මීය යාම හේතුවී ඇත.එමෙන්ම උසස් තත්ත්වයේ කිරි ගව පැටවුන් ප්‍රදේශයේ සිටින ගොවීන් සඳහා ලබාදීමට කටයුතු කරනු ඇති බව දක්වා තිබුණි. |

## 3.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය විසින් කෘෂිකර්ම අධි කළාප පිහිටුවීම සඳහා 2016 වර්ෂයේදී බෙන්තොට වතුයායේ මහ හීන්තැන්න ඉඩමෙන් අක්කර 64 ක් රු.108,780,000 ක් ගෙවා 2018 වර්ෂයේදී ඉඩම පවරා ගැනීමට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද පැවරීමේ කටයුතු සිදු කර නොතිබු අතර ඉදිරි කාලයේදී පැවරීමේ පදනම යටතේ සංවර්ධනය කිරීමට අමාත්‍යාංශයට අවසර ලබාදී තිබුණි. 2020 පෙබරවාරි 26 දින සිදු කරන ලද බිම් පරීක්ෂාවේදී අක්කර 64 ක් වූ මුළු බිම් ප්‍රමාණයම සම්පූර්ණයෙන්ම වල් බිහිවී තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ සඳහා වැය කරන ලද මුදල් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.3 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අගෝස්තු 01 දින රක්ෂණාවරණය අවසන්වූ වාහනයක් 2018 අගෝස්තු 24 දින අනතුරට පත්ව තිබුණු අතර අනතුර මගින් වාහනයට සිදුවූ අලාභය රු.6,783,254 ක් බව අමාත්‍යාංශය විසින් සිදුකරන ලද පරීක්ෂණ වාර්තාව මගින් තක්සේරු කර තිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 (1)(අ) ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සිදු කරන ලද පරීක්ෂණයේ වාර්තාව අනුව වාහනයේ අලාභය වාහනය භාවිතා කරන ලද නිලධාරියාගෙන් සහ රියදුරුගෙන් අයකර ගත යුතු බවට තීරණය වී තිබුණි. තවද, පොදු දේපල අවභාවිතා කිරීම සම්බන්ධයෙන් එම නිලධාරීන්ට විරුද්ධව නීතිමය පියවර ගත යුතු බවත් ප්‍රවාහන විෂය භාර නිලධාරි විසින් වාහනය භාරදීමේදී නොසැලකිළිමත් ලෙස කටයුතු කර ඇති බවත් සඳහන් කර තිබුණි. කෙසේවුවද, සිදුවී ඇති අලාභය 2020 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කර අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොතිබුණි. |

## 3.4 වත්කම් කළමනාකරණය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ බොරැල්ල ප්‍රධාන පුහුණු ආයතනයේ නේවාසිකාගාරය සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පවතින අතර නේවාසිකාගාරය, අංක 02 දරණ දේශණ ශාලාව සහ ආයතනයේ පරිශ්‍රය අළුත්වැඩියාව වෙනුවෙන් රු.6,789,461 ක මුදලක් කොළඹ ප්‍රාදේශිය ලේකම් වෙත ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ලබාදී තිබුණි. එහෙත් එම අළුත්වැඩියා කටයුතු සිදු | අළුත්වැඩියා කටයුතු නියමිත කාලය තුල සිදුකර නේවාසිකාගාරය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම.. | අමාත්‍යාංශයේ ඉංජිනේරු නිලධාරීන් නොමැති නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සිදුකරවා ගැනීමටකටයුතු කර ඇත. එම කාර්යාලවල කාර්ය බහුලතාවය නිසා අදාල අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද කර ඇත.එහෙත් |

| | | | |
|---|---|---|---|
| | කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදිද මෙම කාර්යය සඳහා රු.7,200,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණද 2020 නොවැම්බර් 31 දින දක්වාම එම කටයුතු සිදුකර නොතිබුණි. | | නොවාසිකාගාරයේ අළුත්වැඩියා කටයුතු විගණන දිනෙන් පසුව ආරම්භ කර ඇත. |
| (ආ) | නේවාසිකාගාරය සහ මුළුතැන්ගෙයි අවශ්‍යතාවයන් සඳහා මිළද ගත් රු.3,385,762 ක උපකරණ නේවාසිකාගාර අළුත්වැඩියා කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂ 03 ක පමණ කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි. එසේම මෙම මිළදී ගන්නා ලද විදුලි උපකරණවලට ලබාදී තිබූ සහතික කාලයද අදාල උපකරණ භාවිතා නොකරම කල් ඉකුත්වී තිබූ බවද නිරීක්ෂණය විය. | අවශ්‍යතාවයන් අනුව මිලදී ගැනීමත් නිසි වේලාවට බෙදා හැරීමත් සිදුකළ යුතු වීම . | අළුත්වැඩියාවන් කටයුතු අවසන් වූ වහාම එම උපකරණ මුළුතැන් ගෙය තුළ ස්ථාපනය කරනු ලැබේ. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | නිර්දේශය<br>---------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවුරුදු 70 ඉක්මවූ අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට රු.2,000 ක මාසික දීමනාවක් ලබාදීමට වැඩිහිටියන් 416,667 දෙනෙකුට දිස්ත්‍රික්ක 25 ක් සඳහා රු.10,000,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී වැඩිහිටියන් 410,647 ක් වෙනුවෙන් රු.9,855,532,716 ක් දීමනා ලබා දී තිබුණි. ඒ අනුව අනුමත කරන ලද 6,020 දෙනෙකුට දීමනා ලබා දී නොතිබුණි. | සුදුසුකම් සපුරන වැඩිහිටියන් උපරිමයක් වෙත දීමනා ලබාදීමට කටයුතු කළ යුතු වීම. | මේ සඳහා ඇතැම් දීමනාලාභීන් විසින් අදාළ මාසයන්හි මුදල් ලබා නොගැනීම, දීමනා ලාභීන් පදිංචිය වෙනස්වීම සහ ප්‍රතිලාභීන් මිය යාම හේතු වී තිබුණි. |
| (ආ) | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ම වැඩිහිටි දීමනාව ගෙවීමෙන් පසුව සාරාංශ වියදම් වාර්තාවක් සෑම මාසයක් අවසන්වී ඊළඟ මාසයේ 15 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යැවිය යුතුය. එසේම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ලබාදෙන වාර්තාවන්වලින් සාරාංශ වාර්තාවක් සකස් කර ඊළඟ මාසයේ 30 දිනට පෙර | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුළින් වැඩිහිටියන් වෙත සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | සාරාංශ වියදම් වාර්තා ලබාදී නොමැති දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිලධාරීන් දැනුවත් කර ඇති බවත් ඉදිරියේදී නිසි පරිදි වියදම් සාරාංශ වාර්තා ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයට එවිය යුතුය. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් 2018 ඔක්තෝබර් 15 දිනැති එන්එස්ඊ/ඊඑල් /01/2018 චක්‍රලේඛය මගින් දන්වා ඇතත් අදාල වාර්තා එවීම ප්‍රමාද තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව වැඩිහිටි දීමනාවට හිමිකම ලබාගත් නමුත් දීමනාව ලබානොගත් පුද්ගලයන් පිළිබඳ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 11 ක් වෙතින් සාරාංශ වාර්තා ලබාගෙන නොතිබුණි. මේ අතර දීමනා ලබා ගැනීමට පොරොත්තු ලේඛණගත සංඛ්‍යාව 157,720 ක් වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ආබාධිත පුද්ගලයන් 72,000 ක් සඳහා රු.5,000 ක ආබාධිත දීමනාවක් ගෙවීමට රු.4,320,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ජනවාරි මාසයේ සිට එම මුදල ගෙවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. වර්ෂයේ පළමු මාස 04 ඇතුළත ආබාධිතයන් 32,000 ට රු.3,000 ක් ද, ඊළඟ මාස 02 ඇතුළත රු.5,000 ක් ද, සහ අවසාන මාස 06 සඳහා ආබාධිත පුද්ගලයන් 72,000 ට රු.5,000 ක් වශයෙන් දිස්ත්‍රික්ක 25 වෙත රු.2,864,000,000 ක් ප්‍රතිපාදනය කර රු.2,810,301,645 ක් ආබාධිත දීමනාව වශයෙන් ගෙවීම් කර තිබුණි. ඒ අනුව පොරොත්තු ලේඛණ පිළිබඳව සැළකිළිමත් නොවීම හේතුවෙන් රු.53,698,355 ක් ඉතිරිවී තිබුණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුලින් ආබාධිත සහන දීමනා ලබාදීමට කටයුතු කළ යුතු වීම. | 2019 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා වූ අතුරු සම්මත ගිණුමෙන් එම මාස 04 සඳහා මිලියන 1,440 ක් ලැබී තිබුණි. මෙම දීමනාව රු.3,000 සිට රු.5,000 දක්වා වැඩිකර ඇති බවත් පොරොත්තු ලේඛණ ගත සංඛ්‍යාව 40,000 ක් ඇතුළත්ව 72,000 සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බවත් ආබාධ සහිත තැනැත්තන් සඳහා ජාතික මහ ලේකම් කාර්යාලය දැනුවත්වී ඇත්තේ මාස 04 ක් ගතවීමෙන් පසුවය. එම නිසා මැයි මස සිට රු.5,000 ක් ආබාධිත 32,000 ට පමණක් ගෙවීම නිසා මෙම ඉතිරිය ඇතිවී තිබුණි. ප්‍රතිලාභීන් 72,000 ට ජූලි 01 දින සිට රු.5,000 බැගින් ගෙවන ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් 2019 ජූලි 11 දිනැති ලිපියෙන් අනුමැතිය ලබාදී තිබුණි |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ පළමු මාස 04 තුළ ආබාධිත පුද්ගලයන් 32,000 වෙනුවෙන් රු.5,000 ක් නොගෙවීමත් ජනවාරි මාසයේ සිට ආබාධිත පුදුගලයන් 72,000 සඳහාම දීමනාව ඇස්තමේන්තු කර තිබියදීත් එම පුද්ගලයන්ට රු.5,000 ක් බැගින් දීමනාව ගෙවීමට ආරම්භ නොකිරීමත් හේතුවෙන් ආබාධිත දීමනාව රු.1,509,698,355 ක් හෙවත් සියයට 35 ක් දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවතිණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුලින් ආබාධිතයන්ට සහන සැළසීමට කටයුතු කළ යුතු වීම. | ඉතිරිවූ පතිපාදන වලින් හිඟ දීමනා (2019 ජනවාරි සිට අප්‍රේල් දක්වා) ගෙවීමට උත්සාහ කළද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. ප්‍රතිපාදන වෙන්වී ඇති ආකාරය පිළිබඳව පූර්ව දැනුවත්වීමක් සිදු නොවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වූ අතර ඉදිරියේදී මෙවැනි ගැටළු ඇතිවී නොවීම සඳහා අදාල බලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ වකුගඩු රෝගීන් සඳහා දීමනා ලබාදීම සඳහා පුද්ගලයන් 24,666 ක් වෙනුවෙන් රු.1,479,985,000 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර රු.1,451,305,400 ක් පුද්ගලයින් 24,188 ක් සඳහා ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.28,679,600 ක් ඉතිරිව පැවතුණද එම දිස්ත්‍රික්ක 11 ඇතුළත වකුගඩු ආබාධිත පුද්ගලයින් 6,179 ක් පොරොත්තු ලේඛණයට ඇතුළත්වී තිබුණි. | ප්‍රතිපාදන උපරිම උපයෝජනය තුලින් රෝගීන්ට සහන සැලසීමට කටයුතු කල යුතු වීම. | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් 11 තුළ ප්‍රතිපාදන යවන ලද 24,666 ට අමතරව පොරොත්තු ලේඛණගත පිරිසක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින ලදි. පෙර සිටම ගෙවීම් කරන ලද 24,666 සඳහා රු. 1,479,985,000 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලදී. |
| (ඊ) | දිස්ත්‍රික්ක 25 තුළින් හඳුනාගෙන තිබූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව 13,863 ක් වශයෙන් පොරොත්තු ලේඛණයක් සකස් කර තිබුණු නමුත් වාර්ෂිකව දීමනාව ලබාගන්නා දිස්ත්‍රික්ක 11 ට අමතරව අනිකුත් දිස්ත්‍රික්කවල වකුගඩු රෝගීන් වෙත මෙම දීමනාව ලබාදීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික්ක 14 ක වකුගඩු රෝගීන් 7,684 ක් සම්පූර්ණයෙන්ම දීමනාව ලබාදීමෙන් බැහැරවී තිබුණි. | සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රෝගීන්ට සහන සැළසීමට කටයුතු කල යුතු වීම. | සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රු.5,000 ජීවනාධාරය ගෙවීමට 2020 සැප්තැම්බර් මස සිට අනුමැතිය ලැබී ඇති බව දක්වා තිබුණි. |
| (උ) | අමාත්‍යාංශය සතු වාහන 03 ක් අළුත්වැඩියා කටයුතු සඳහා නියෝජිත ආයතනවලට ලබා දී වර්ෂ 01 ත් 05 ත් අතර කාලයක් ගතව තිබුණද එම වාහන අළුත්වැඩියා කර අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.තවද,අමාත්‍යාංශයට අයත් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 05 ක් අපහරණය කිරීමට කටයුතු නොකර වසර 02 කට ආසන්න කාලයක සිට අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල්කර පැවතුණි. | වාහන කාලීනව අළුත්වැඩියා කිරීමට හා අපහරණය කල යුතු වාහන නොපමාව අපහරණයට කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

## 4. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බොරැල්ල ග්‍රාම සංවර්ධන පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ තනතුර 2018 අගෝස්තු මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද එම ආයතනයේ නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ තනතුරු 02 ක් ද දීර්ඝ කාලීනව පුරප්පාඩු පැවති අතර, අනුමත බඳවා ගැනීමේ පරිපාටියට බැහැරව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සේවයේ යොදවා තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ කාර්යභාරය ඉටුකර ගැනීම ගැටළුකාරී තත්ත්වයක පැවතුණි. | ආයතනයේ කාර්ය භාරයන් පවත්වා ගෙන යාම සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයකු පත්කළ යුතු වීම. | පුරප්පාඩුවී ඇති තනතුරු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සඳහා රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි. |